අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

ව්‍යාපාර අධ්‍යයනය - I පත්‍රය

පිළිතුරු සඳහා මඟ පෙන්වීම

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
(1)	4	(16)	4
(2)	5	(17)	3
(3)	3	(18)	3
(4)	4	(19)	2
(5)	2	(20)	5
(6)	5	(21)	5
(7)	5	(22)	4
(8)	1	(23)	5
(9)	4	(24)	3
(10)	3	(25)	3
(11)	3	(26)	5
(12)	4	(27)	2
(13)	3	(28)	5
(14)	2	(29)	1
(15)	2	(30)	5

The National e-learning Portal for The General Education

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

31. (අ) අයිතිකරු / ගනුදෙනුකරු (පාරිභෝගිකයා)
(ආ) අභ්‍යන්තර / අවස්ථා හා තර්ජන

32. (අ) ප්‍රාග්ධන වියදම් හා වර්තන වියදම් / බදු හා බදු නොවන
(ආ) ශක්තියක් / දුර්වලතාවය

33. (අ) පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව
(ආ) මාර්තු 15 හා ජනවාරි 26

34. (අ) සමූපකාර / රාජ්‍ය සමාගම්
(ආ) සීමිත පොදු සමාගම්

35. (අ) විදේශ විනිමය
(ආ) ස්ථාවර / තාවකාලික (පිළිවෙලින් අවශ්‍ය නැත)

36. (අ) රොබට් L කාට්ස් / F.W. ටෙලර්
(ආ) පොරොත්තු කාලය

37. (අ) නැවත ඇණවුම් (ROL)
(ආ) විකුණුම් සංකල්පය

38. (අ) කාර්මික ආරවුල්
(ආ) පසුබිම් / බුද්ධි පරීක්ෂණ

39. (අ) අධි තෝලනය
(ආ) ණයකර හෝ බැංකු ණය හෝ වරණීය කොටස්

40. (අ) ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාලය (LAN) / පුළුල් ක්ෂේත්‍ර ජාලය (WAN)
(ආ) විධායක සාරාංශය

(ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා 'අ' කොටසට එක් ලකුණක් ද, 'ආ' කොටසට එක් ලකුණක් ද හිමි වේ.)

41. 1. පතල් හා කැණීම්
2. නිමවුම් කර්මාන්ත
3. ඉදි කිරීම් කර්මාන්ත
4. විදුලිය, ගෑස්, ජලය **(කරුණු 04ට ලකුණු 02යි)**

42. 1. භාණ්ඩ
2. භාවිතය අනුව
3. ඍජු සේවා
4. කාර්මික භාණ්ඩ **(කරුණු 04ට ලකුණු 02යි)**

43. ★ අරමුණ අනුව ★ හිමිකම අනුව
★ වගකීම අනුව ★ නීතිමය පුද්ගලභාවය අනුව
★ පැවැත්ම අනුව

(කරුණු 04ට ලකුණු 02යි)

44. ★ විචාරාත්මක ඇනුවත්භාවය
★ සක්‍රීය සහභාගීත්වය
★ සමාජය ගැන සැළකිලිමත් වීම
★ පරිසරය පිළිබඳ සැළකිලිමත් වීම
★ සහයෝගීතාව **(කරුණු 04ට ලකුණු 02යි)**

45. ★ පිරිවැය අඩුවීම
★ රහස්‍යභාවය
★ පාර්ශව කිහිපයකට එකවර යැවිය හැකි වීම
★ ගබඩා කර තබා ගත හැකි වීම
★ පණිවුඩය සන්නිවේදය වූ බව සනාථ වීම
★ වේගවත් ක්‍රමයක් වීම
★ ඕනෑම අවස්ථාවක ක්‍රියාත්මක කළ හැකි වීම
★ ව්‍යාප්තිය වැඩිවීම **(කරුණු 04ට ලකුණු 02යි)**

46. ★ සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහය
★ මූල්‍ය විගණනය
★ අය වැය ලේඛන මගින් සිදු කරන පාලනය
★ ගිණුම් අනුපාත විශ්ලේෂණය **(කරුණු 04ට ලකුණු 02යි)**

47. ★ ප්‍රමිති ස්ථාපිත කිරීම
★ කාර්ය ඵල මැනීම
★ විචලන හඳුනා ගැනීම
★ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම **(කරුණු 04ට ලකුණු 02යි)**

48. ★ අරමුණු හා පරමාර්ථ පදනම් වීම
★ ප්‍රායෝගික වීම
★ නම්‍යශීලී වීම
★ තේරුම් ගැනීම පහසු වීම
★ නිශ්චිත කාල සීමාවක් සඳහා වීම
★ සෑම මට්ටමකම කළමනාකරුවන් සහභාගී කරවීම **(කරුණු 04ට ලකුණු 02යි)**

49. ★ ශ්‍රම පිරිවැටුම
★ සේවක ප්‍රවාසිතාව
★ ශ්‍රම ඵලදායකත්වය
★ කාර්මික සම්බන්ධතා **(කරුණු 04ට ලකුණු 02යි)**

50. ★ දළ ලාභ අනුපාතය
★ ශුද්ධ ලාභ අනුපාතය
★ ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය
★ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය **(කරුණු 04ට ලකුණු 02යි)**

ලකුණු $2 \times 20 = 40$

I පත්‍රය සඳහා මුළු ලකුණු $60 + 40 = 100$

අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016
ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය
පිළිතුරු සඳහා මඟ පෙන්වීම

I කොටස

1.(i) (අ) ★ ප්‍රමාණවත් මූල්‍ය ශක්තිය.
- ★ අභිප්‍රේරණය වූ සේවක පිරිසක් සිටීම.
- ★ සිත් ගන්නා ව්‍යාපාර නාමයක් තිබීම.
- ★ ආකර්ෂණීය ස්ථානගත වීම.
- ★ ස්ථාවර වෙළෙඳපොලක් තිබීම.
- ★ පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත් කටයුතුවල නියැලීම.
- ★ නිවැරදි නායකත්වය.
- ★ ආචාර ධර්ම පද්ධතියට අනුව කටයුතු කිරීම.

(කරුණු 04ට ලකුණු 02යි)

(ආ) ★ දැඩි තරගකාරිත්වය.
- ★ පිරිවැය අධික වීම.
- ★ සේවක බලපෑම් අධික වීම.
- ★ පාරිභෝගිකයන් සංවිධාන ගතවීම.
- ★ තාක්ෂණික වෙනස්වීම්වලට අනුගත විය යුතුවීම.

(කරුණු 04ට ලකුණු 02යි)

(ii) (අ) සේවාව සැපයීමට මූලිකව යොදා ගන්නේ භාණ්ඩය.
උදා: වෛද්‍යවරයාගේ සේවය සැපයීමට බෙහෙත්, වෛද්‍ය උපකරණ ආදිය යොදා ගැනීම.

(නිදසුන් සහිත පිළිතුරට ලකුණු 02යි)

(ආ)

භාණ්ඩ	සේවා
● ස්පර්ශ්‍ය වේ.	● අස්පර්ශ්‍ය වේ.
● ගබඩා කළ හැකිය.	● ගබඩා කළ නොහැකිය.
● නිෂ්පාදකයාගෙන් වෙන් කළ හැකිය.	● නිෂ්පාදකයාගෙන් වෙන් කළ නොහැකිය.
● නිෂ්පාදනය, පරිභෝජනය එකවිට සිදු නොවේ.	● නිෂ්පාදනය, පාරිභෝජනය එකවිට සිදු වේ.
● සමාන ස්වරූපයක් ගනී.	● සමාන ස්වරූපයක් නොගනී.

(වෙනස්කම් 4කට ලකුණු 02යි)

(iii)(අ) අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයන්, ණය සැපයුම්කරුවන්, රජය

(කරුණු 04ට ලකුණු 02යි)

(ආ) ★ අයිතිකරුවන් - පැවැත්ම තහවුරු කර ගැනීමට
- ★ සේවකයන් - සේවක එලදායිත්වය වැඩි කර ගැනීමට / සේවක තෘප්තිය ඇති කිරීමට
- ★ ගනුදෙනුකරුවන් - අදාළ භාණ්ඩ හෝ සේවාව සඳහා වෙළෙඳපොල සුරක්ෂිත කර ගැනීමට
- ★ ණය සැපයුම්කරුවන් - අඛණ්ඩව අරමුදල් සම්පාදනය කර ගැනීමට
- ★ රජය - විශේෂ සහන ලබා ගැනීමට / යටිතල පහසුකම් ලබා ගැනීමට

(කරුණු 02ට ලකුණු 02යි)

(iv)(අ) ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේදී ව්‍යාපාර නාම, සන්නම හෝ වෙළෙඳ ලකුණු මුල් කරගෙන එම කාර්යය කරයි. එය සැඟවුනු ප්‍රචාරණයකි.
උදා: පාසල් ක්‍රීඩා තරග උත්සවවලදී ව්‍යාපාර අනුග්‍රහය දැක්වීම.

(කරුණු 04ට ලකුණු 02යි)

(ආ) ★ ආයෝජකයන් ★ සේවකයන්
★ පාරිභෝගිකයන් /ගනුදෙනුකරුවන් ★ පරිසරය

(කරුණු 04කට ලකුණු 02යි)

(v) (අ) ★ ප්‍රවාහන හා මාර්ග පහසුකම් ★ සන්නිවේදන පහසුකම්
★ බලශක්ති පහසුකම් ★ කැළි කසළ ඉවත් කිරීම
★ ජල පහසුකම් ★ ඉඩම් සකස් කර දීම
★ ගොඩනැගිලි ඉදිකර දීම **(කරුණු 04කට ලකුණු 02යි)**

(ආ) ★ ක්‍රමික ආර්ථික වර්ධනය හා සංවර්ධනය ★ පූර්ණ සේවා නියුක්තිය
★ ආර්ථික ස්ථායිතාව ★ සාධාරණ ආදායම් ව්‍යාප්තිය
★ යහපත් අන්තර්ජාතික වෙළෙඳාම **(කරුණු 04ට ලකුණු 02යි)**

2. (i) (අ) ★ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම ★ සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිවීම.
★ ගුණාත්මක භාණ්ඩ පරිභෝජනයට ඉඩ ලැබීම. ★ පාරිභෝගික ආරක්ෂණය තහවුරු වීම.
★ සමස්ථ ආර්ථිකය සංවර්ධනය වීම. ★ සම්පත් නාස්තිය, අපතේ යෑම් අවම වීම

(කරුණු 04ට ලකුණු 02යි)

(ආ)(1)★ කිරුම් මිණුම් වංචා සිදු කිරීම. ★ මිල වෙනස් කිරීම.
★ ව්‍යාජ ලේබන භාවිතය. ★ භාණ්ඩ බාල කිරීම් හා මිශ්‍ර කිරීම්.
★ ව්‍යාජ සන්නම් භාවිතය ★ නැති ගුණ මවා පෑම .

(කරුණු 02ට ලකුණු 01යි)

(2) තොරතුරු දැන ගැනීමේ අයිතිය **(ලකුණු 01යි)**

(ii)(අ) ලාභ ඉපයීම හෝ සමාජ සුභ සාධනය අරමුණු කරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීමේ නිරත ආයතන ව්‍යාපාර සංවිධාන වන අතර පොදු අරමුණක් ඉටු කර ගැනීම සඳහා ඒකරාශී වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් සමාජ ඒකකයක් සංවිධානයක් වේ.

(ලකුණු 02යි)

(ආ) 1. මූල්‍ය ශක්තිය 2. කීර්තිනාමය / ප්‍රතිරූපය
3. විශ්වාසවන්තභාවය 4. දැනට පවත්වාගෙන යන ව්‍යාපාර කටයුතු

(කරුණු 04ට ලකුණු 02යි)

(iii) (අ) ★ සීමාසහිත සමාගම් ★ සීමාරහිත සමාගම්
★ ඇපයෙන් සීමිත සමාගම් ★ විදේශීය සමාගම් **(ලකුණු 01යි)**

(ආ) සංස්ථාපන සහතිකය **(ලකුණු 01යි)**

(ඇ) **කොටස් හිමියන්ට**

★ කොටස් පැවරීම නිදහසේ කළ හැකි වීම
★ ඉහළ ලාභාංශ ලැබීම **(ලකුණු 01යි)**

සමාගමට

★ වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකිය
★ වෙනත් ක්‍රම මගින් මූල්‍ය රැස් කිරීමේ පහසුව **(ලකුණු 01යි)**

(iv) (අ) ★ ඇඩි තරගකාරීත්වය ★ ක්ෂණික තීරණ ගැනීමේ අපහසුව
★ විවෘතව පවතින කාලය ප්‍රමාණවත් නොවීම ★ සේවක උනන්දුව අවම වීම
★ ගනුදෙනුකරුවන්ගේ උදාසීනත්වය ★ ණයට ගනුදෙනු සිදු නොකිරීම
★ ප්‍රවර්ධන ක්‍රම යොදා නොගැනීම **(කරුණු 04ට ලකුණු 02යි)**

(ආ)★ සමාජයීය ව්‍යවසායකත්වය
★ අභ්‍යන්තර ව්‍යවසායකත්වය
★ කාන්තා ව්‍යවසායකත්වය
★ බහු ව්‍යවසායකත්වය

(ලකුණු 02යි)

(v) (අ) කුඩා ව්‍යාපාරිකයා වෙළෙඳපොලට ඉදිරිපත් කරන්නේ කුඩා ඒකක ප්‍රමාණයකි. ඔහුගේ වෙළෙඳ පිරිවැටුමද ඉතා පහළය. ලාභදායිත්වය හා මූල්‍ය තත්ත්වයද ඉතා පහළ මට්ටමක පවතී. ඒ නිසා ඔහුට කළ හැකි බලපෑම ද අවමය. **(ලකුණු 02යි)**

(ආ)★ සැලසුම් සකස් කිරීමේ දුර්වලතා
★ මූල්‍ය දුෂ්කරතා
★ වෙළෙඳපොල ගැටලු
★ මහා පරිමාණ ව්‍යාපාරවලින් එල්ලවන තර්ජන
★ රජයේ දිරි ගැන්වීම් ප්‍රමාණවත් නොවීම
★ කළමනාකරණ දුර්වලතා
★ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
★ ව්‍යවසායකත්ව දුර්වලතා **(කරුණු 04ට ලකුණු 02යි)**

3. (i) (අ) නිත්‍ය තැන්පතු පොලී පහසුකම් අනුපාතය **(ලකුණු 01යි)**

(ආ) 1. රුපියල් බිලියන 10
2. රුපියල් බිලියන 05 **(ලකුණු 01යි)**

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් තැන්පතු ගිණුම් පවත්වාගෙන යමින් මුදල් මැවීමට හැකියාව ඇති, විදේශ විනිමය ගනුදෙනුවල යෙදෙන මූල්‍යායතන විශේෂයක් වන අතර බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් ලබාගෙන තිබුණද, ජංගම ගිණුම් පවත්වාගෙන යෑම හා විදේශ විනිමය ගනුදෙනුවල යෙදිය නොහැකි එහෙත් ඉතිරි කිරීමේ හා කාලීන ඉතුරුම් ගිණුම් පවත්වා ගෙන යා හැකි මූල්‍ය ආයතන විශේෂයකි. **(ලකුණු 02යි)**

(ii) (අ) මූල්‍ය උපකරණ හා ඒවා නිකුත් කරන ආයතනවල මූල්‍ය ශක්තිය පිළිබඳව කරනු ලබන ඇගයීම හෙවත් තක්සේරුව ණය ශ්‍රේණිගත කිරීම නම් වේ. මෙමගින් මූල්‍ය ආයතන සඳහා මූල්‍ය වගකීම් ඉටු කිරීමේ හැකියාව පිළිබඳව ශ්‍රේණියක් ලබා දේ. **(ලකුණු 02යි)**

(ආ)★ Fitch Ratings Lanka Ltd
★ Ram Ratings Lanka Ltd
★ S & P Ratings Lanka Ltd **(ලකුණු 02යි)**

(iii)(අ) අණකරු, අණලද්දා, ධාරකයා **(ලකුණු 02යි)**

(ආ) 1. අණකරුට. **(ලකුණු 01යි)**
2. "ලේඛණය අවලංගු කරන ලදී." යන්න යොදා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදීම. **(ලකුණු 01යි)**

(iv)(අ) දේපලේ අගය
රක්ෂිත අගය
සිදු වූ හානියේ වටිනාකම **(කරුණු 02ට ලකුණු 02යි)**

(ආ) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී සේවකයන්ට, ගනුදෙනුකරුවන්ට, පාරිභෝගිකයන්ට, පොදු ජනතාවට සිදුවන හානි වෙනුවෙන් ව්‍යාපාරිකයන් වන්දි ගෙවිය යුතුය. මෙම වගකීම පිළිබඳ අවදානම රක්ෂණය කිරීම වගකීම් රක්ෂණය නම් වේ. **(ලකුණු 01යි)**

ඔප්පු වර්ග : 1. නිෂ්පාදන වගකීම් රක්ෂණය
2. වෘත්තීය වගකීම් රක්ෂණය
3. සේවා යෝජක වගකීම් රක්ෂණය
4. මහජන වගකීම් රක්ෂණය **(කරුණු 02ට ලකුණු 01යි)**

(v) ප්‍රවාහන මූලිකාංග හතරම විස්තර කෙරෙන පරිදි කරුණු ඇතුළත් සම්පූර්ණ පිළිතුරට ලකුණු 04යි.

4. (i) (අ) අභ්‍යන්තර - අයිතිකරු, සේවකයන්, කළමනාකරුවන් **(ලකුණු 01යි)**
බාහිර - සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්, ආයෝජකයන්, රජය, ප්‍රජාව **(ලකුණු 01යි)**

(ආ) **වාසි**

- ★ ගැටලුවක් වඩාත් විස්තරාත්මකව, සාකච්ඡා කොට ඉදිරිපත් කළ හැකි වීම.
- ★ තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම.
- ★ තොරතුරු වඩාත් ඉක්මණින් ඉදිරිපත් කළ හැකි වීම.
- ★ රහස්‍යභාවය සුරැකීම.
- ★ පසු පෝෂණයක් ලබා ගත හැකිවීම. **(කරුණු 02ට ලකුණු 01යි)**

අවාසි

- ★ භාෂාමය ගැටලු ඇතිවීම
- ★ වාචිකමය දුර්වලතා ඇති පාර්ශව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇතිවීම
- ★ තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නොමැති වීම

(කරුණු 02ට ලකුණු 01යි)

(ii) (අ) 1. නිෂ්පාදන තොග වෙළෙන්දා 2. ස්වාධීන තොග වෙළෙන්දා
3. වාණිජ තොග වෙළෙන්දා 4. නියෝජිත තොග වෙළෙන්දා
5. පූර්ණ සේවා සපයන තොග වෙළෙන්දා 6. සීමිත සේවා සපයන තොග වෙළෙන්දා
(ලකුණු 02යි)

(ආ) 1. තොග බෙදා හැරීම 2. තොග ගබඩා කිරීම
3. වෙළෙඳපොල තොරතුරු ලබාදීම 4. ප්‍රවර්ධන කටයුතු
5. තොග ඇසුරුම් කිරීම (වර්ග කිරීම) **(කරුණු 02ට ලකුණු 02යි)**

(iii)(අ) 1. චක්‍ර නිෂ්පාදනය
2. නිෂ්පාදනයේ අතිරික්තයක් හෝ ඌණතාවයක් ඇතිවීම
3. නිෂ්පාදන පිරිවැය
4. ගෝලීයකරණය
5. වර්ණයන් වෙනස්වීම
6. භාණ්ඩ ප්‍රවර්ධනය
7. වෙළෙඳ බාධක අවම වීම **(කරුණු 02ට ලකුණු 02යි)**

(ආ) 1. ආනයන සීමා කිරීම්
2. අපනයන සීමා කිරීම්
3. අපනයන / ආනයන තහනම් කිරීම
4. වෙළෙඳ ගිවිසුම්
5. ඇඩි විනිමය ප්‍රතිපත්ති **(කරුණු 04කට ලකුණු 02යි)**

(iv) ප්‍රතිලාභ

1. විශාල වෙළෙඳපොලකට පිවිසීමට ඉඩ ලැබේ.
2. විකුණුම් ප්‍රමාණය ඉහළ යාම. ඒ නිසා ලාභය ඉහළ යාම.
3. වැඩි ඉල්ලුමක් සඳහා නිපදවන නිසා මහා පරිමාණ පිරිමැසුම් ලැබීම. ඒ නිසා නිෂ්පාදන පිරිවැයද පහළ යාම.
4. අන්තර්ජාලය හරහා ප්‍රවර්ධනය කළ හැකිවීම. **(කරුණු 02කට ලකුණු 02යි)**

ගැටලු

1. වැඩි තරගකාරිත්වයට මුහුණ දීමට සිදුවීම.
2. අලෙවිකරණ පිරිවැය ඉහළ යාම.
3. බෙදාහැරීමේ පිරිවැය ඉහළ යාම.
4. තීරු ගාස්තු වැනි වෙළෙඳ බාධකවලට මුහුණ දීමට සිදුවීම.
5. භාෂාමය, සංස්කෘතික, ගැටලු ඇතිවීම. **(කරුණු 02කට ලකුණු 02යි)**

(v) (අ) 1. තීරු බදු අය කිරීම .
2. රේගු වාර්තා නිකුත් කිරීම.
3. වංචනික ලෙස කෙරෙන ආනයන අපනයන පාලනය කිරීම.
4. රජයට උපදෙස් දීම.
5. රේගු ආඥා හා පනත් ක්‍රියාත්මක කිරීම. **(කරුණු 04කට ලකුණු 02යි)**

(ආ) ★ යුරෝපා සංගමය (Europian Union)
★ උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ සංගමය NAFTA
★ යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමය ETTA
★ දකුණු ආසියාතික වරණාත්මක වෙළෙඳ ගිවිසුම SAFTA
★ බිම්ස්ටෙක් BIMSTEC **(ලකුණු 02යි)**

II කොටස

5. (i) අග්‍ර, මධ්‍යම හා පළමු පෙළ කළමනාකරණ මට්ටම් හා තාක්ෂණික කුසලතා, මානව කුසලතා හා සංකල්පනාත්මක කුසලතා එක් එක් මට්ටම්වලදී විවිධ ප්‍රමාණයන්ගෙන් තිබිය යුතුය.
(මෙම අංශ දැක්වීමට හා සම්බන්ධය පැහැදිලි වන පිළිතුරකට ලකුණු 04යි)

(ii) (අ) 1. තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස් වීම.
2. ආර්ථික අස්ථාවර තත්ත්වයන්
3. දේශපාලන අස්ථාවර බව
4. සේවකයන් සංවිධානගත වීමේ ප්‍රවණතාව
5. ගෝලීයකරණ බලපෑම්
6. ගනුදෙනුකරුවන්ගේ සංවිධානාත්මක බලපෑම් **(කරුණු 4කට ලකුණු 04යි)**

(ආ) 1. ගැටලු හඳුනා ගැනීම
2. විකල්ප විසඳුම් ගොඩ නැගීම
3. විකල්ප ඇගයීම
4. හොඳම විකල්පය තේරීම
5. ක්‍රියාත්මක කිරීම **(කරුණු 04ට ලකුණු 02යි)**

(iii)(අ) 1. සේවක ඵලදායීතාව ඉහළ නංවා ගත හැකිවීම.
2. හොඳ සේව්‍ය - සේවක සම්බන්ධතාවක් පැවතීම.
3. සේවකයන්ගේ විශේෂ දක්ෂතාවලින් ප්‍රයෝජන ගත හැකි වීම.
4. සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම.
5. ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගත හැකිවීම.
6. තෘප්තිමත් වූ සේවක පිරිසක් බිහිවීම. **(ලකුණු 02යි)**

(ආ) ★ ඉදිරි පෝෂණ පාලනය
උදා : ● යන්ත්‍ර නිවැරදිව නඩත්තු කිරීම.
● සේවකයන් පුහුණු කිරීම **(කරුණු 02ට ලකුණු 01යි)**

★ පසු පෝෂණ පාලනය
උදා : ● යන්ත්‍ර අළුත්වැඩියා කිරීම.
● අවසාන නිෂ්පාදිතය පරීක්ෂා කිරීම **(කරුණු 02ට ලකුණු 01යි)**

(iv)(අ) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යෙදවුම්, නිමවුම් බවට පරිවර්තනය කිරීමට අදාළව සිදු කරන සියලුම කටයුතු මෙහෙයුම් කළමනාකරණයට අයත් වන අතර මෙහෙයුම් කළමනාකරණයට අයත් සීමිත කාර්යභාරයක් නිෂ්පාදන කළමනාකරණයට අයත් වේ. **(ලකුණු 02යි)**

(ආ) **ඇණවුම් පිරිවැය** - ගෙන ඒමේ කුලී, තීරු ගාස්තු, තොග පරීක්ෂා කිරීමේ ගාස්තු, තැරැව් ගාස්තු වියදම්, ඇණවුම් ලිපිකරු වියදම් **(කරුණු 02ට ලකුණු 01යි)**

නඩත්තු පිරිවැය - සේවක වැටුප්, රක්ෂණ ගාස්තු, ගබඩා කුලී, විදුලි වියදම්, තොග නාස්ති වීම්, අපතේ යෑම් **(කරුණු 02ට ලකුණු 01යි)**

(v) (අ) Q - උපරිම තොග මට්ටම
Q_1 - යළි ඇණවුම් ප්‍රමාණය / ආර්ථික ඇණවුම් ප්‍රමාණය
Q_2 - පොරොත්තු කාල ඉල්ලුම
Q_3 - ආරක්ෂිත තොගය
T - පොරොත්තු කාලය
T_1 - චක්‍රීය කාලය
L - නැවත ඇණවුම් මට්ටම / යළි ඇණවුම් මට්ටම
S - තොග පරිභෝජන සීඝ්‍රතාව **(ලකුණු $1/2 \times 8 = 04$යි)**

6. (i) (අ) 1. කාර්ය හඳුනා ගැනීම
2. වැඩ බෙදීම
3. දෙපාර්තමේන්තුකරණය
4. අධිකාරිය හා වගකීම් පැවරීම
5. වැඩ කිරීමේ ප්‍රමිති ඇති කිරීම
6. සම්පත් බෙදා දීම
7. සමායෝජනය **(කරුණු 04ට ලකුණු 02යි)**

(ආ) යම් කාර්යයක් හෝ කාර්යභාරයක් ඉටු කිරීමට යම් පුද්ගලයෙකු බැඳී සිටීම වගකීම වන අතර පහළ කළමනාකරුවකු යම් කාර්යයක් පිළිබඳව වාර්තා කිරීමට, පිළිතුරු දීමට ඉහළ කළමණාකාරිත්වයට ඇති බැඳීම වගවීමයි. **(ලකුණු 02යි)**

(ii) (අ) කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා කාර්ය වැඩපොළ මධ්‍යස්ථාන, ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ, සහාය සේවා යනාදිය සැලසුම් කිරීම මෙහෙයුම් පිරියත සැලසුම් කිරීම නම් වේ.
(ලකුණු 02යි)

(ආ) ★ ද්‍රව්‍ය හා යන්ත්‍ර භාවිත කිරීමේ කාර්යක්ෂමතාව වර්ධනය වීම
- ★ ඉඩකඩවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකිවීම
- ★ ද්‍රව්‍ය භාවිත කිරීමේ පිරිවැය අඩු කර ගත හැකි වීම
- ★ ද්‍රව්‍ය හා සේවකයන් චලනය වීමේදී ඇතිවිය හැකි බාධා අවම වීම
- ★ අනතුරු අවම වීම
- ★ සන්නිවේදනය, සමායෝජනය හා සුපරීක්ෂණය පහසු වීම
- ★ සේවකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ යාම **(කරුණු 04ට ලකුණු 02යි)**

(iii) (අ) ★ මනා ක්‍රියාකාරිත්වය
- ★ කල් පැවැත්ම
- ★ විශ්වාසවන්තභාවය
- ★ ප්‍රමිතියට අනුකූල වීම
- ★ උචිත බව
- ★ ආරක්ෂිත බව **(කරුණු 04කට ලකුණු 02යි)**

(ආ)1. සමස්ත ගුණත්ව කළමනාකරණය ආයතනයේ සියලුම මටටම්වල ගුණත්වය සුරැකීමේ ක්‍රියාවලියයි. මෙහිදී ඒ ඒ මට්ටම්වල ගුණත්වයන් ආරක්ෂා කරන අතර ඒ තුළින් ආයතනයේ සමස්ථ ගුණත්වය සුරැකීම අපේක්ෂා කෙරේ. **(ලකුණු 01යි)**

2. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය යනු ක්‍රියාවලියේ කාර්ය සාධනය පිළිබඳ දත්ත රැස්කර ඒවා රූප සටහන්, වගු සහ ප්‍රස්තාර මඟින් අදාළ පාර්ශව වෙත සන්නිවේදනය කිරීම. **(ලකුණු 01යි)**

(iv) (අ) නිෂ්පාදිතය, හුවමාරුව, වෙළෙඳපොල, අලෙවිකරු **(කරුණු 04ට ලකුණු 02යි)**

(ආ)හුවමාරු ක්‍රියාවලියේ වැඩි ක්‍රියාකාරිත්වයක් පෙන්වන පාර්ශවය අලෙවිකරුය. ගැණුම්කරු වැඩි ක්‍රියාකාරිත්වයක් පෙන්වන්නේ නම් ගැණුම්කරු අලෙවිකරු වේ.
නිදසුන් : වී අලෙවි මණ්ඩලය ගොවීන්ගෙන් වී මිලදී ගනී. එහෙත් අලෙවිකරුවෙකු ලෙස සැළකේ. **(ලකුණු 02යි)**

(v)(අ) අලෙවිකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලුම කොටස් ව්‍යාපාර පරිසරයට වඩා යෝග්‍ය ලෙස ඒකාබද්ධ ප්‍රවේශයකින් ක්‍රියාත්මක වීමේ වැදගත්කම නිසා සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය බිහිවිය. **(ලකුණු 02යි)**

(ආ) ★ අලෙවිකරණ සංකල්පය
පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඊට අනුකූලව භාණ්ඩ හා සේවා නිර්මාණය කළ යුතු බවත්, ඒ තුළින් පාරිභෝගික තෘප්තිය ලඟා කරදීම මුල් කරගත් සංකල්පයයි.
- ★ ගනුදෙනුකරු සංකල්පය
එක් එක් ගනුදෙනුකරු ඉලක්ක කොට ඔවුන්ගේ සුවිශේෂි වුවමනා මැනවින් හඳුනාගෙන ඒවා තෘප්තිමත් කරලීමට ප්‍රයත්න දැරීම මෙම සංකල්පයේ අදහසයි. **(ලකුණු 02යි)**

7. (i) (අ) පුද්ගලයන්ගේ සහ ආයතනවල අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා යොමු වූ සමාජයීය සහ කළමනාකරණ ක්‍රියාවලියකි. **(ලකුණු 01යි)**

(ආ) විෂම ගති ලක්ෂණවලින් යුක්ත වූ සමස්ථ වෙළෙඳපොල සමජාතීය ගති ලක්ෂණවලින් යුක්ත වූ කණ්ඩායම් බෙදා වෙන් කිරීමයි. **(ලකුණු 01යි)**
- ★ මැනිය හැකි බව
- ★ වෙන් කොට හඳුනා ගත හැකි බව
- ★ ළඟා විය හැකි බව
- ★ ක්‍රියාත්මක කළ හැකි බව **(ලකුණු 02යි)**

(ii) (අ) නිෂ්පාදිතයක් සඳහා පාරිභෝගිකයා ගෙවන වටිනාකමයි. පාරිභෝගික ඉල්ලුම සඳහා බලපාන වැදගත් සාධකයක් ලෙස මිල දැක්වීමට පුලුවන. **(ලකුණු 02යි)**

(ආ) ★ නිෂ්පාදිතයේ පිරිවැය
- ★ වෙළෙඳපොල තරගකාරිත්වයේ ස්වරූපය
- ★ තරගකරුවන්ගේ මිල ගණන්
- ★ ව්‍යාපාරයේ පරමාර්ථය
- ★ මිල ඉල්ලුම් නම්‍යතාව
- ★ නව භාණ්ඩයක් ද, පවතින භාණ්ඩයක් ද යන වග **(ලකුණු 02යි)**

(iii) (අ) යම්කිසි විකුණුම්කරුවෙකු හෝ විකුණුම්කරුවන් කණ්ඩායමකගේ නිෂ්පාදිත තරගකාරී නිෂ්පාදිතවලින් වෙන්කොට හඳුනා ගැනීමට භාවිත කළ හැකි නමක්, වචනයක්, සංකේතයක්, සන්නම ලෙස හැඳින්වේ. සන්නමක උච්චාරණය කළ හැකි කොටස සන්නම් නාමය ලෙස හඳුන්වන අතර සන්නමක් ලියාපදිංචි කර නීත්‍යානුකූල තත්ත්වයක් ලබා ගත් විට එය වෙළෙඳ ලකුණ ලෙස හඳුන්වයි. **(ලකුණු 02යි)**

(ආ) **නිෂ්පාදකයාට**
1. ඇණවුම් ලබා ගැනීමේදී පහසු වීම
2. නීතිමය ආරක්ෂාව ලබා ගැනීම
3. ව්‍යාපාරයට වටිනාකමක් නිර්මාණය වීම
4. අනෙකුත් තරගකාරී සන්නම්වලින් තම ආයතනයේ සන්නම වෙන් කොට හඳුනා ගත හැකි වීම

ගනුදෙනුකරුවන්ට
1. පහසුවෙන් භාණ්ඩ තෝරා ගත හැකිවීම
2. ව්‍යාජ භාණ්ඩවලින් ආරක්ෂා විය හැකිවීම
3. තමන්ට අවශ්‍ය භාණ්ඩ පැහැදිලිව ලබා ගත හැකිවීම
4. පැමිණිලි ඉදිරිපත් කිරීම පහසුවීම **(ලකුණු 02යි)**

(iv) (අ)
1. ව්‍යාපාරයේ මූල්‍ය සැලසුම් සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම
2. ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහය නියාමනය
3. අතිරේක අරමුදල් භාවිත කිරීම හා ලබාගැනීම පිළිබඳ තීරණය
4. අය වැය සම්පාදන
5. ආයෝජන නිර්දේශ කිරීම
6. ව්‍යාපාරයේ අනාගත වර්ධනය සඳහා වූ අනාගත ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය
7. බැංකු සහ ප්‍රාග්ධන වෙළෙඳපොල සම්බන්ධතා ගොඩනගා ගැනීම **(ලකුණු 02යි)**

(ආ)

අභ්‍යන්තර	**බාහිර**
රඳවා ගත් ලාභ	කොටස් නිකුතුව
ක්ෂය වෙන් කිරීම්	ණයකර නිකුතුව
වත්කම් විකිණීම	බැංකු ණය
	කල් බදු

(ලකුණු 02යි)

(v) (අ) තොග පිරිවැටුම් අනුපාතය

$$\frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}} = \left(\frac{110\,000}{55\,000}\right) = 2$$

(ලකුණු 02යි)

(ආ)ලාභදායකත්ව අනුපාතය

$$\frac{\text{ශුද්ධ ලාභය}}{\text{ප්‍රාග්ධන ආයෝජන}} \times 100$$

A

$$\frac{60\,000}{300\,000} \times 100$$

20%

B

$$\frac{40\,000}{120\,000} \times 100$$

33 1/3%

යෙද වූ ප්‍රාග්ධනයට ඉපයුම් A සමාගමේ 20% කි. B සමාගමේ 33 1/3% කි. ඒ අනුව B සමාගම වඩා සාර්ථකය. **(ලකුණු 02යි)**

8. (i) (අ) රැකියා නිර්මාණය, රැකියා විශ්ලේෂණය, මිනිස්බල සැලසුම්කරණය, සේවකයින් ආකර්ෂණය, සේවකයින් තෝරා ගැනීම හා බඳවා ගැනීම, අනුස්ථාපනය **(ලකුණු 02යි)**

(ආ) පරිගණකය හා අන්තර්ජාලය උපයෝගී කරගෙන සංවිධාන අරමුණු ඉටු කර ගැනීමට උපකාරී වන්නා වූ හැකියා සහ ධනාත්මක ආකල්ප වලින් යුතු රැකියා අපේක්ෂකයන් ආයතනය වෙත අද්දවා ගැනීමේ සංචිතයක් ඇති කර ගැනීමේ ක්‍රියාවලිය විද්‍යුත් ආකර්ෂණය නම් වේ. **(ලකුණු 01යි)**

- ★ ආයතනයට ඉහළ ප්‍රයෝජනයක් ලැබේ.
- ★ ආයතනයේ කටයුතුවලට පහසුවීම
- ★ පිරිවැය අවමවීම
- ★ ලිපි ලේඛන වියදම් අවමවීම **(ලකුණු 01යි)**

(ii) (අ) ප්‍රතික්‍රියා සහිතවීම, සජීවී බව, සංචලනය කළ හැකිවීම, මානව සම්පත අනුව සෙසු සම්පත් පාලනයට ලක්වීම, මානව සම්පත අභිප්‍රේරණය කළ හැකිවීම, පුහුණුව තුළින් සංවර්ධනය කළ හැකිවීම. **(ලකුණු 04යි)**

(ආ) දෙන ලද කාල පරිච්ඡේදයක් තුළ එක් සේවකයෙකුගේ නිමවුම ශ්‍රම ඵලදායකත්වයයි.

$$\text{ශ්‍රම ඵලදායකත්වය} = \frac{\text{නිශ්චිත කාලය තුළ මුළු නිමවුම}}{\text{සේවයේ නියුක්ත මුළු සේවක සංඛ්‍යාව}}$$

(ලකුණු 01යි)

(ඉ) සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර සාමූහික කේවල් කිරීම් තුළින් ඇති කර ගන්නා එකඟතාවය සාමූහික ගිවිසුම ලෙස හඳුන්වයි. සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර සාකච්ඡා මගින් ඇති කර ගන්නා විසඳුම් ලිඛිත ගිවිසුමක් ලෙස සකස් කෙරේ. **(ලකුණු 01යි)**

(iii) (අ) බන්ධනාගාර, ත්‍රිවිධ හමුදා, පොලීසිය **(ලකුණු 01යි)**

(ආ)තොරතුරු පද්ධතියක් යනු සංවිධානයන්හි තීරණ ගැනීමේ හා පාලනය සඳහා සහාය වන තොරතුරු රැස් කර ගැනීම, සැකසීම හා බෙදා හැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවයකින් යුක්ත වූ උපාංග වල එකතුවකි. **(ලකුණු 01යි)**

(iv) **භාවිත කරන මට්ටම් අනුව**

1. උපක්‍රමික මට්ටම
2. කළමනාකරණ මට්ටම
3. දැනුම් මට්ටම
4. මෙහෙයුම් මට්ටම **(ලකුණු 02යි)**

භාවිතය අනුව

1. ගනුදෙනු සැකසුම් පද්ධති
2. දැනුම් කාර්ය පද්ධති
3. කාර්යාල ස්වයංකරණ පද්ධති
4. කළමනාකරණ තොරතුරු පද්ධති
5. තීරණ උපකාරක පද්ධති
6. විධායක උපකාරක පද්ධති **(ලකුණු 02යි)**

(v) (අ) 1. ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීමට
2. ව්‍යාපාර සැලසුමෙන් මග පෙන්වීමක් ලැබීම
3. බැංකු ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ හැකි වැදගත් උපකරණයක් වීම
4. ප්‍රධාන තනතුරු සඳහා සේවකයින් ආකර්ෂණය කර ගැනීමට **(ලකුණු 02යි)**

(ආ) 1. සමච්ඡේද විග්‍රහය
2. ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශන
3. ඇස්තමේන්තුගත ශේෂ පත්‍ර
4. ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශ **(ලකුණු 02යි)**